# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

දිනය / Date - 2025.09.29 පැය 0615 | දුරකථන අංකය / Tel.NO - 011-2887973 | මගේ අංකය / My NO - D/Media/Out/1809/2025 | විද්‍යුත් ලිපිනය / E-Mails - dir.media@police.gov.lk


**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු**

### 01. ව්‍යාජ වාහන අංක තහඩු, ජීව පතරොම් හා හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධපුර කඳවුර.

2025.09.28 වන දින දහවල් කාලයේ කොට්ටාව පොලිස් වසමේ රුක්මලේ පාර, කොට්ටාව ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කදවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීක් සිදු කර හෙරොයින් ග්‍රෑම් 75 මිලිග්‍රෑම් 400 ක්, විවිධ වර්ගයේ ජීව පතරොම් 458 ක්, ටී-56 පතරොම් ගැබක්, ව්‍යාජව සකස්කල වාහන අංක තහඩු 30 ක්, ආදායම් බලපත්‍ර 15 ක්, රක්ෂණ සහතිකපත් 15 ක් හා ජංගම දුරකථන දෙකක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන බස්නාහිර පළාත් දකුණු දිසා අපරාධ කොට්ඨාසය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 24 ක් වන අඟුලාන, මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බස්නාහිර පළාත් දකුණු දිසා අපරාධ කොටඨාසය මඟින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. සැකකටයතු මරණයක් - කඩුවෙල පොලිස් වසම.

2025.09.28 වන දින උදෑසන කාලයේ කඩුවෙල පොලිස් වසමේ කඩුවෙල පාලම යට කැලණි ගඟෙහි සැකකටයුතු ලෙස මියගිය පුද්ගල මෘත ශරීරයක් ඇති බවට කඩුවෙල පොලිස් ස්ථානය වෙත ලද තොරතුරක් මත කඩුවෙල පොලිස් ස්ථානය මඟින් විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැති අතර වයස අවුරුදු 35ත් 40ත් අතර වයසේ පසුවන පිරිමි පුද්ගලයෙකි.**

පොලිසිය විසින් සිදුකල විමර්ශනයෙදි මෘත ශරීරයෙහි කලිසමක පාද කොටස් දෙකෙළවර ගැට ගසා එහි ගල් පුරවා මරණකරුගේ ඉනෙහි ගැට ගසා තිබී ඇත. මෘත ශරීරය සම්බන්ධයෙන් පශ්චාත් මරණ පරීක්ෂණ සඳහා අධිකරණ වෛද්‍ය හා විෂවේද ආයතනය වෙත භාර දී ඇත. කඩුවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 03. දියේ ගිලී පුද්ගලයෙකු මියයාමක් - මුන්දලම පොලිස් වසම.

2025.09.28 වන දින උදෑසන කාලයේ මුන්දලම පොලිස් වසමේ පිංකට්ටිය වැවේ මසුන් ඇල්ලීම සඳහා ගිය පුද්ගලයෙකු නිවසට නොපැමිණීම සම්බන්ධයෙන් මුන්දලම පොලිස් ස්ථානය වෙත කරන ලද පැමිණිල්ලක් මත නිලධාරීන්

කණ්ඩායමක් ප්‍රදේශවාසීන්ගේ සහය ඇතිව සිදුකල සෝදිසි කිරීමේදී මෙම පුද්ගලයා වැවෙහි දියේ ගිලී මියගොස් සිටියදී මෘත ශරීරය සොයා ගෙන ඇත.

**මරණකරු වයස අවුරුදු 56 ක් වූ උඩප්පුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය හලාවත රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මුන්දලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - ජාඇල පොලිස් වසම.

2025.09.28 වන දින අළුයම් කාලයේ ජාඇල පොලිස් වසමේ ජාඇල මිනුවන්ගොඩ මාර්ගයේ මොන්ටා හන්දිය අසලදී ජාඇල දෙස සිට මිනුවන්ගොඩ දෙසට ධාවනය වූ කාර් රථයක් මාර්ගය හරහා ගමන් කළ පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පදික පුද්ගලයා බරපතල තුවාල ලබා රාගම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 60 ක් වූ කණුවන, ජාඇල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය රාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ කාර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර ජාඇල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - මොරවක පොලිස් වසම.

2025.09.28 වන දින රාත්‍රී කාලයේ මොරවක පොලිස් වසමේ දෙනියාය අකුරැස්ස මාර්ගයේ 61 වන කිලෝ මීටර් කනුව ආසන්නයේදී දෙනියාය දෙසට ධාවනය වූ යතුරුපැදියක් ඉදිරියෙන් ධාවනය වූ කැබ් රථයකට හා බස් රථයකට ඉස්සර කිරීමට යාමේදී බස් රථයේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පැදිකරු හා පසුපැදිකරු බරපතල තුවාල ලබා කොස්නිල්ගොඩ රෝහලට ඇතුලත් කිරීමේදී පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 19 ක් වූ මොරවක ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කොස්නිල්ගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මොරවක පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - තලංගම පොලිස් වසම.

2025.09.28 වන දින අළුයම් කාලයේ තලංගම පොලිස් වසමේ කොල්ලුපිටිය කඩුවෙල මාර්ගයේ තලාහේන ප්‍රදේශයේදී මාළඹේ දෙස සිට කොස්වත්ත දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කරගැනීමට නොහැකිව පසුපැදිකරු සමඟ මාර්ගයේ පෙරළී ගොස් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි කාර් රථයක ඉදිරිපස ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පැදිකරු හා පසු පැදිකරු බරපතල තුවාල ලබා කොස්වත්ත රෝහලට ඇතුලත් කිරීමේදී පැදිකරු මියගොස් ඇත. පසු පැදිකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා කොළඹ ජාතික රෝහලට මාරු කර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 21 ක් වූ ශ්‍රී සුභූතිපුර, බත්තරමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කොස්වත්ත රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ කාර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර තලංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - පුනරීන් පොලිස් වසම.

2025.09.28 වන දින උදෑසන කාලයේ පුනරීන් පොලිස් වසමේ යාපනය මන්නාරම මාර්ගයේ 18 කණුව අසලදී පුනරීන් දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන පෙරලි ගොස් අනතුරක් සිදුව ඇත. අනතුරින් පැදිකරු හා පැදියෙහි ගමන්කල ඥාති දැරියක් බරපතල තුවාල ලබා වාවකච්චේරිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු දැරිය මියගොස් ඇත.

**මියගිය දැරිය වයස අවුරුදු 05 ක් වූ කොඩිගාමම් ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

පුනරීන් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. මාරක රිය අනතුරක් - මඳුරන්කුලිය පොලිස් වසම.

2025.09.29 වන අද දින අළුයම් කාලයේ මඳුරන්කුලිය පොලිස් වසමේ පුත්තලම කොළඹ මාර්ගයේ සෙම්බැට්ට ප්‍රදේශයේදී පුත්තලම දෙසට ධාවනය වූ කාර් රථයක් විරුද්ධ දෙසින් පැමිණි ලොරි රථයක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් කාර් රථයේ රියදුරු බරපතල තුවාල ලබා පුත්තලම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 55 ක් වූ සාලියවැව, පුත්තලම ප්‍රදේශයේ පදිංචි කරුවලගස්වැව පොලිස් ස්ථානයට අනුයුක්තව සේවය කල පොලිස් සැරයන්වරයෙකි.**

මෘත ශරීරය පුත්තලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර මඳුරන්කුලිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**